පන්නල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට හිඟ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස රු.997,784 ක මුදලක් 2014 වර්ෂයේ ජනවාරි මස ලැබී තිබුණද, එය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2013 වසරේ බඳවාගෙන තිබුණු නවක නිලධාරීන්ට අදාලව 2014 නොවැම්බර් මස වැටුප් ප්‍රතිපූර්ණය වූ රු.825,000ක් 2014 දෙසැම්බර් මස ලැබී තිබියදී නැවත ජර්නල් සටහන් අංක 90 මගින් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ගිණුම්ගත කිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,000,496 ක් වුවද එය රු.5,315,663 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.4,315,167 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලේ හිඟ ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ගෙවීම් කළ රු.900,000 ක මුදලක් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම හර කිරීම වෙනුවට විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික (108) වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයවන විට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය තුල ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබූ රු.200,000 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුලද නැවත ජර්නල් සටහන් අංක 83 මගින් නැවත ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා වියදම් ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා අරමුදල විසින් අයකළ රු.1,569,421 ක දඩ පොලිය ණය මුදල් ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) වැටකෙයාව හා කඳානේ ගෙදර වෙළඳ සංකීර්ණ දෙකෙහි කඩ කාමර 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.1,523,934 ක පෙර ගෙවුම් (කීමනී) මුදල් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුල රු.430,718 ක අත්තිකාරම් පියවීම් අත්තිකාරම් ගිණුම බැර නොකර වර්ෂයේ වියදම් ගිණුම් බැර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

සභාවේ සේවය කර විශ්‍රාම ගන්වනු ලැබූ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම මත සමාලෝචිත වර්ෂය අවසානයවන විට ගෙවිය යුතු ශේෂය රු.3,312,679 ක්ව තිබුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 13 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු .18,294,387 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 224,704,174 ක් විය. ඉන් රු.72,345,233 ක් සඳහා කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් නොවූ අතර කාලවිශ්ලේෂණ ඉදිරිපත් වූ රු.152,358,941 න් දළ වශයෙන් 1% ක් පමණ ලෙස රු.1,523,589 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන අගයන් වේ.

(ආ) ලැබිය යුතු ගිණුම් තුල හිඟහිටි වෙනත් ආදායම් රු.66,220,140 ක් පැවති අතර එතුල වූ රු.18,708,947 ක 2009 වර්ෂයේ සිට පැවත එන මූලධන ආධාර ශේෂයක් වූ අතර තවත් රු.31,094,572 ක් ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයක් විය.

(ඇ) ලැබිය යුතු ගිණුම් තුල රු.151,873,068 ක කර්මාන්ත ණයගැති ශේෂයක් පැවති අතර ඉන් රු.10,963,860 ක් 2013 ට පෙර සිට පවතින ශේෂයන් විය.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 183,017,168 ක් විය. ඉන් දළ වශයෙන් 11% ක් වූ රු.19,602,537ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

(ඉ) ගෙවිය යුතු ගිණුම් ශේෂය තුල රු.12,683,768 ක් සාමාන්‍ය ණයහිමියන් වූ අතර ඉන් දළ වශයෙන් 35% ක් රු.4,400,395 ක් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය විය.

(ඊ) ගෙවිය යුතු ගිණුම් තුල රු.145,756,327 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් පැවති අතර ඉන් දළ වශයෙන් 15% ක් වූ රු.21,469,732 ක් 2013 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයන් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.25,505, 584 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.17,530,159 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.326,037 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,204,122 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.242,443,846 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.219,895,405 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.40,078,600 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.125,644,344 න් රු.92,437,977 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එය ප්‍රතිශතයක් ලෙස දළ වශයෙන් 74% ක් විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.242,443,845 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.108,114,185 න් රු.56,800,964 ක් දළ වශයෙන් 53% ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් 84% ක් ලෙස රු.47,772,908ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ගෙවල් කුළී

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ගෙවල් කුළී ශේෂය රු.1,031,551 ක් වූ අතර ඒ තුල වර්ෂ ගණනාවක සිට අය වීමට ඇති රු.341,525 ක ශේෂයක්ද පැවතුණි.

2.3.2 පෙර ගෙවුම් මුදල්

වැටකෙයාව හා කඳානේ ගෙදර වෙළඳ සංකීර්ණවලට අදාලව පිළිවෙලින් රු.539,236 ක් හා රු.991,727 ක පෙර ගෙවුම් මුදල් හිඟ පැවතුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.5,315,663 ක් ද, මුද්දර ගාස්තු ප්‍රමාණය රු.31,094,572 ක් ද විය. මෙම හිඟය උසාවි දඩ වලට අදාලව රු.4,914,998 දක්වා ද මුද්දර ගාස්තු වලට අදාලව රු.12,421,641 දක්වා ද 2015 ජූනි 30 වන විට අඩු වී තිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී රු.7,204,172 ක් වැය කර ඉදිකර තිබුණු වැටකෙයාව වෙළඳ සංකීර්ණය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ජලය හා විදුලිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, කඩ කාමර 06 කට අදාලව කුලී ගිවිසුම්වලට එළඹී නොතිබීම හේතුවෙන් කඩ කුලිය අය කිරීමද ගැටළුකාරී වී තිබුණි.

(ආ) 2011 වර්ෂයේ නිම කර තිබූ කඳානේ ගෙදර වෙළඳ සංකීර්ණයෙහි පහත මාලයේ කඩ කාමර 10 ක් බදු දීම සඳහා 2012 සහ 2013 වර්ෂවල මිළ ගණන් කැඳවා තිබුණද 2014 දෙසැම්බර් 31 වන විට ඉන් කඩ කාමර 03 ක් සඳහා පමණක් මිළ ගණන් ඉදිරිපත් වි තිබුණි.

(ඇ) 2007 ජූනි 07 දින සභාවේ සිදු වී ඇති රු.206,869 ක මුදල් වංචාව සම්බන්ධයෙන් එවකට මුදල් භාරව කටයුතු කර ඇති ප්‍රධාන කළමනාකරණ සහකාරවරයාගෙන් 50% ක මුදලක් අය කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණු අතර ඉතිරි 50% ක මුදල අයකර ගත යුත්තේ කෙසේද යන්න පැහැදිලි කර නොතිබුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය